## අප කුමක් කල යුතුද ?

*යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ සුභාරංචිය දේශනාකරමින්: කාලය සම්පූර්ණ විය, දෙවියන්වහන්සේගේ රාජ්‍ය සමීපය පසුතැවිලිවී සුභාරංචිය අදහාගනිල්ලායයි කී සේක.*
*මාර්ක් 1 : 14-15*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපව කැඳවනු ලබනවා, අපගේ පාපයට පසුතැවිලි වීමට සහ සුභාරංචිය විශ්වාස කිරීමෙන් දෙවියන්වහන්සේගේ ප්‍රේමය සැමටම.

"පසුතැවිලි වීම යනු අපගේ මනස වෙනස් කර ගැනීමයි. එහි අර්ථය නම් ව්‍යාජ නමස්කාර වලින් වැලකී සිටීම සහ ස්වර්ගයේ පියාණන් විශ්වාස කිරීමය. කවරෙක්ද උන්වහන්සේගේ පුත්‍රයා එවනු ලබන්නේ මෙතරම් අපට ප්‍රේම කරන පිණිස.

පසුතැවිලි වීම යනු අපගේ ජීවිතය වෙනස් කර ගැනීමයි. එහි අර්ථය නම් පාපය නැමැති අඳුරේ ජිවත් වීම නැවැත්වීම සහ ආලෝකයේ ජිවත් වීම ආරම්භ කිරීම, පියාණන්ගේ ප්‍රේමය සහ සමාව ලැබීමය.

පසුතැවිලි වීම යනු යේසුස්වහන්සේ ඉගැන්වූ ලෙසම ප්‍රේමයේ මාර්ගයේ ගමන් කිරීමයි උන්වහන්සේ කී සේක.

*ඔබගේ මුළු හදවතින්ද ඔබගේ මුළු ආත්මයෙන්ද ඔබගේ මුළු බුද්ධියෙන්ද ඔබගේ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරව. මේක උතුම් වූ පළමු වෙනි වූ අණදැනය. මෙය හා සමාන දෙවෙනි එකක් තිබේ, එනම්, ඔබට මෙන් ඔබගේ අසල්වාසියාටද ප්‍රේම කරව යනුය මෙම අණදැ දෙක පිට මුළු ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් පිහිටා තිබේ.*
*මතෙව් 22 : 37-40*

### යේසුස්වහන්සේගේ මාර්ගය අනුගමනය කිරීමට පටන් ගැනීමට නම්, කරුණාවෙන් පහත යාච්ඤාව කියවන්න :

ස්වර්ගීය **පියාණෙනි** මට ප්‍රේම කරන නිසා ස්තූතියි. ඔබ වහන්සේගේ දරුවෙක් ලෙස මා භාර ගැනු නිසා ස්තූතියි. ඔබගේ **පුත්‍රවූ** යේසුස්වහන්සේ එවමින් මා ගලවා ගෙන මාගේ සියලු පාපයෙන් ගලවා ගත් නිසා ස්තූතියි.

දයාබර පියාණෙනි **ශුද්ධාත්මයාණන්** මාගේ හදවතේ ජිවත් වන පිණිස එවූ නිසා ස්තූතියි. ශුද්ධාත්මයාණෙනි පැමිණෙන්න. සියලුම සත්‍යතාව තුල මට මග පෙන්වන්න. දෙවිඳුන්ට සහ අසල්වැසියන්ට ප්‍රේම කරන්නට උගන්වමින් යේසුස්වහන්සේගේ මාර්ගයේ ගමන් කරන්නට මා ශක්තිමත් කරන්න.

යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරමි. ආමෙන් !

දෙවිඳුන්ගේ ප්‍රේමය වැඩිදුර සැමදෙනාම දැනගැනීම සඳහා හමුවන්න:

**ලංකා සුභාරංචි සංගමය**
660/02,04,
අරලිය මාවත,
ශ්‍රියානගේමුල්ල,
සීදූව,
ශ්‍රී ලංකාව.

Parliament Reg No: 46
Reg Date: 1975-10-05
Email: cea1church@gmail.com
Tele No: (0094) 772270903/112265890

*In partnership with:*

**AsiAfrica Ministries, Inc. (USA)**
Website: www.AsiAfricaMinistries.org
Email: office@AsiAfricaMinistries.org

# සුභ ආරංචිය
# ඔබ සැමට !

*සුභ ආරංචි ගෙනෙන්නාවූ, සමාදානය ප්‍රකාශ කරන්නාවූ, යහපත ගැන හොඳ ආරංචි ගෙනෙන්නාවූ, ගැලවීම ප්‍රකාශකරන්නාවූ ; නුඹේ දෙවියන්වහන්සේ රජකම් කරන සේකැයි සියොන්ට කියන්නාවූ තැනැත්තාගේ පාද කඳු පිට කොපමණ අලංකාරද.. යෙසායා 52:7*

---

## යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභආරංචිය
### "යහපත් ආරංචියකි" ඔබ සැමට !

යේසුස්වහන්සේ ස්වර්ගයේ සිට පොළවට පැමිණියේ උන්වහන්සේගේ ප්‍රේමය අපට පෙන්වන පිණිසය !

*මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑම දෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.*
*යොහාන් 3:16-17*

## දෙවියන්වහන්සේ ප්‍රේමයයි

දෙවියන්වහන්සේගේ ප්‍රේමය ගැන අපට ඉගැන්විය හැක්කේ යේසුස්වහන්සේට පමණි. මන්ද පියාණන්වහන්සේව හඳුනන්නේ යේසුස්වහන්සේ පමණි (මතෙව් 11:27). අන් කිසි දිව්‍යැසිවරයෙකු හෝ ගුරුවරයෙකු යේසුස්වහන්සේ තරම් උන්වහන්සේව නොහඳුනන්නේය. මක්නිසාද යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයා නිසාය.

ශුද්ධ වූ බයිබලය අපට උගන්වන්නේ ඒ දෙවියන්වහන්සේ අපගේ ප්‍රේමණීය පියාණන් සහ අප උන්වහන්සේගේ ප්‍රේමණීය දරුවන් බවයි.

*අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි කියනු ලබන ලෙස පියාණන්වහන්සේ කෙබඳු ප්‍රේමයක් අපට දී වදාළසේක් දැයි බලාපල්ලා, අපි එබඳුවෝමය.*
*1 යොහාන් 3 : 1*

ලෝකය මැවීමට ප්‍රථමයෙන්, අපගේ ස්වර්ගික පියාණන් අපව උන්වහන්සේගේ ප්‍රේමණීය දරුවන් වශයෙන් තෝරා ගත්හ. ලෝකය මැවීමට ප්‍රථමයෙන් දෙවිපියාණන් අපව උන්වහන්සේගේ පවුලට "වෙන්කර" ගත්හ! ශුද්ධ වූ බයිබලය පවසන ලෙස:

*අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පිය වූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. මක්නිසාද උන්වහන්සේ ඉදිරියට ප්‍රේමයෙන් ශුද්ධව නොකැළැල්ව සිටින පිණිස, ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ අප තෝරා ගත් ලෙසම, උන්වහන්සේතුළ ස්වර්ගීය ස්ථාන වල සියලු ආත්මික ආශීර්වාද වලින් උන්වහන්සේ අපට ආශීර්වාද කළසේක. උන්වහන්සේ විසින් ප්‍රේමවන්තයාණන් වහන්සේ තුළ අපට නොමිලයේ දුන්නාවූ තමන්වහන්සේගේ කරුණාවේ මහිමයේ ප්‍රශංසාව සඳහා තමන් වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන පුත්‍රයන් වීමට අප පෙර නියම කළසේක. ඒ ප්‍රේමවන්තයාණන් වහන්සේතුළ උන්වහන්සේගේ කරුණාවේ සම්පතේ ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපේ වරද වලට කමාව ඇත්තේය.*
*එපීස 1 : 3 - 6*

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාව මනුෂ්‍යයෙකුගේ ස්වරූපයෙන් අප අතරට එවූ සේක. (යොහාන් 1:14; පිලිප්පි 2:5-8). යේසුස්වහන්සේ ජිවත් වූයේ සම්පූර්ණ වූ ප්‍රේමයෙන්ද, ඇදහිල්ලෙන්ද සහ කීකරුකමින්ද. එම නිසා අප සියලු දෙනා උන්වහන්සේගේ ශුද්ධ වූ ජීවිතය අනුගමනය කළ යුතුය.

කෙසේ වුවත් අප පව්කරුවන් වන බැවින්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා පූජා කලේ අපව පාපයේ බලයෙන් හා මරණයෙන් මුදවා ගැනීම සඳහාය.

පසුව ඔහු මරණයෙන් නැගිට, යේසුස්වහන්සේ, ස්වර්ගයේ "පියාණන්ගේ නිවසට" ආපසු ගියේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේ, අපට ස්ථානයක් පිළියෙල කරන ලදි. මන්ද අප එහි සදාකාලික ප්‍රේමයෙන්ද, සමාදානයෙන්ද, ප්‍රීතියෙන්ද සහ අලංකාරත්වයෙන්ද පියාණන්වහන්සේගේ නිවසේ ජිවත් වන පිණිසය. යේසුස්වහන්සේ කී සේක:

*මාගේ පියාණන්වහන්සේගේ ගෘහයේ බොහෝ වාසස්ථාන ඇත්තේය එසේ නොවූයේ නම් මා විසින් නුඹලාට කියනවා ඇත. මක්නිසාද නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි.*
*යොහාන් 14 : 2*

දෙවියන්වහන්සේ අපගේ ප්‍රේමණීය **පියාණන්ය**. උන්වහන්සේගේ **පුත්‍රයාණන්** වන යේසුස්වහන්සේ එවනු ලැබුවේ අපගේ පාපය ඉවත් කිරීමට සහ අපට පියාණන්ගේ නිවසේ ස්ථානයක් පිළියෙල කිරීම පිණිසය. පියාණන් සහ පුත්‍රයාණන්, පියාණන්වහන්සේගේ ප්‍රේමය අප හදවත් තුල තබන පිණිස සහ සත්‍යතාවය කරා ගමන් කරවන පිණිස **ශුද්ධාත්මයාණන්** එවූ සේක.(යොහාන් 3:16; රෝම 5:5; යොහාන් 16:13).